### සන්න සහිත

# දහම් ගැට මාලාව.

මොක් සැපතට අක ර
තිත් ගණඳුරට දිවයු ර
තිලොවට එකෘ මිතු ර
වඳිමි බැතියෙන් උතුම් මුනිව ර

1 පැ සී දෙතිස් කුණපය රූකොට ග න් තේ
ව සී නවදෙරින් කුණු වැඩකුත්නැ ක් තේ
එ සී නොකොට පස්කම්රස කැමැ ත් තේ
සි සී මද නුවණ මන්දැයි අනි ත් තේ

පැසෙනලද කෙස් ආදි දෙතිස්කුණපයවූ (ශරීරය) රූපයක්කොට තොපහොත් අලඞ්කාරයක්කොට ගත්තේය. මුඛ නාසාදි නවදෙරින් වැඩක්නැති සෙම් සොටු ආදි කුණු වහනයවේ. එය සිහිනොකොට (සත්‍වතෙම) රූප ශබ්දාදි පඤ්චකාම රසයම කැමැත්තේය, (මෙය) නිත්දිතයි. අනිත්‍ය ශරීරය කෙරෙහි නුවණ මඳව වාසයකරන්නේ කිමෙක්ද?

2 සො ඳි න් එ දා සිට දවසැර ඉ න් නේ ය
අ න නු මු දා තැන තැන ඇවිදි න් නේ ය
හොඳනොහොඳ මදකුත් නොම දන් නේ ය
මා ය න දා නුඹ දියපත් ව න් නේ ය

උපන්දා පටන් යෙහෙන් දවස් ඇර ඉන්නෙහිය. අන නොහැරම තැන්තැන්වලම ඇවිදින්නෙහිය. හොඳ නරක ටිකක්වත් නොදන්නෙහිය. සත්‍වයා වන මා පරලොව යන දවසෙහි එම්බා, ශරීරය නුඹ විනාශයට පත්වන්නෙහිය.

3 වැලඳි දා පටන් දෙන්නම ඇවි ද් දේ
ඇරලා යන්ට කිමදෝ කළ වැරැ ද් දේ
ගියදා නුඹ මට වන්නේ වැරැ ද් දේ
ඇර ගියදා තනිවම දමති බැ ද් දේ

නාම රූපයයි කියනලද හිත කය දෙක සැදුණුදා පටන් ඒ අප දෙදෙනාගේ එක්ව ඇවිදීමවිය. මේ ශරීරයවූ මා ඇර පරලොව යාම පිණිස කළාවූ වරද කිම? චිත්තයවූ නුඹ ශරීරය හැර ගිය දවසෙහි (ශරීරය වන) මට වන්නේ වරදෙක්ය, එසේ හැර ගිය දවසෙහි ශරීරයවූ මා තනිවම බැද්දේ දමත්.

4 උපන්දා පටන් දෙන්නම අත් නෑ රේ
පිටත් වුණු තැනම යන්නේ දුරුකත රේ
පුරුදු සඳිනි මා යන්නේ දුරු කත රේ
එතොත් වරෙන් තේතොත් කාටද බා රේ

උපන් දවස පටන් කාය චිත්ත දෙක අත්හැර ඉඳ පිටත්වුණු තැන්හිම දුර කාන්තාරවල යන්නේය. පුරුදු චිත්තය මා විසින් ගමන්කරනු ලබන්නේ දුරවූ සංසාර කාන්තාරයෙහිය. එතොත් නුඹ වරෙන්න, නැත්නොත් කවරකුට බාරද?

5 ග ම්-වැ ද ගියෝ විළිවැද සිත් නුවා ණෝ
පෙම්-ඇති කතුන් දකපුව සිත නොමා ණෝ
අ න්-වෙන බසක් නොව ඇසූ සවනතා ණෝ
ම ම්-වද සොඳුරෙදුක් උසුලන ගොනා ණෝ

සොඳුර—සිත ලජ්ජාවට පැමිණියන් ග්‍රාම්‍යාලාප හෙවත් ගම්වල පාවිච්චිවන තිරශ්චීන වචනම තේරුමගන්නා නුවණක් ඇති, ප්‍රේමය ඇත්තාවූ ස්ත්‍රීන් දුටුකල්හි නුසුලන තරම් රාගයක් උපදින සිතක් ඇති, ඒ ස්ත්‍රීන්ගේ මිස අන්‍යයන්ගේ වෙන වචනයක් නොම ඇසූ කන් දෙකක් ඇති, දුක් උසුලන්නාවූ වෘෂභ තෙම මම්වද?

6 ගි න න යාළු මා කී බස් නොග න් දූ සී
අ න න මෙනන කොතනත් කල්බඳි න් දූ සී
කොතන ගියත් නුඹ හා මම් නොයි න් දූ සී
ප න න ඉසුරු මාවතකට නොය න් දූ සී

තෘෂ්ණා චිත්ත නමැති යහළුව, මාකී බස් නුඹ නොගන්නෙහිද? අධ්‍යාත්මික බාහිරයයි කියනලද තමා පිළිබඳ රූප ශබ්දාදි පඤ්ච කාමය කෙරෙහිද, අන්‍යයන් පිළිබඳ පඤ්ච කාම සම්පත්තිය කෙරෙහිද, පසුබිසාවූද දැන් පවසිනාවූද මතු පැමිණෙන්නාවූද මේ පඤ්ච කාමාදීන්යෙහි ආලය බඳින්නෙහිද, කොතන ගියත් තෘෂ්ණාව නුඹ හා සමග මම නොඉඳිම්ද? ප්‍රාර්ථනාකරනලද ඓශ්වර්‍ය්‍ය මාර්ගයකට * නොයම්ද?

* මෙහි මාර්ග ශබ්දයෙන් සෝවාන් ආදි සතර මග බැව් සැළකියයුතුය

7 තුඹ ව න් නා කොතනත් කල් බඳි න් දූ සි
අප ඉ න් නා ගෙයි ඉන්නට නොදෙන් දූ සි
ගැණ දු න් නා අට පහ දෙකනොද න් දූ සි
හොඳ දන් නා අය කී මඟ නොය න් දූ සි

තෘෂ්ණාව, තුඹ වනාහි මුල කීලෙස කොයි සත්වයන්ගෙන් ආලය බඳින්නෙහිය, ආත්මය නැමති ගෙයි වාසයකරන හිතනමැති අපට ඒ ගෙයි එකගව වාසයකිරීමට නොදෙන්නෙහිද, ගණින් වශයෙන් දුන්නාවූ අෂ්ටාඞ්ගශීල පඤ්චශීල් දෙක නොදන්නෙහිද? සත්‍යය දන්නාවූ ආර්‍ය්‍යයන් වහන්සේලා කී ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි නොයන්නෙහිද?

8 උ ප යා සොයා දන රැස්කර තබ න් දූ සි
ස ප යා අරිවූ අඹුදරුවන් රකි න් දූ සි
ස ප යා දන්පිනක් මදකුත් නොදෙ න්දූසි
නොප යා නොදෙනඅත් නැතුවානොද න්දූසි

සොයා වස්තුව සම්පාදනයකොට රැස්කර තබන්නෙහිද, ඒසැපයු වස්තුවෙන් නපුරුවූ අම්බිකාව හා පුත්‍රයන් රකින්නෙහිද, සම්පාදනයකොට මදකුත් දන පුණ්‍යකර්මයන් නොකරන්නෙහිද, නොපා මරණයට යානොදෙන්නාවූ ආත්මයක් හැනිබව නොදන්නෙහිද?

9 දූන් සැපනම් කරතල ජල උපාම ලූ
පින් පව්නම් රතසක මෙන් පෙරළේ ලූ
දන් පින්නම් මොක්පුරයට මඟ පෑ ලූ
අන් සැපතට සිත් ලොබ නොකරන් සා ළු

මේ පවතින සැපයනම් අත්ලෙහි වත්කල දිය පිකකට උපමාලූ, පින්පව් දෙක වනාහි රථ චක්‍රමෙන් පෙරලෙන ස්වභාවලූ, දන පුණ්‍යය නම් නිර්වාණ නුවරට මාර්ග පෑවාක්වැනිලු, යහලුව අනුන්ගේ සැපතට චිත්තලෝභය නොකරන්න.

10 සා ර පෝය නොකරව් පව් පරදූ ර
මා ර සෙනග ඇවිදිති පොත අතනෑ ර
නෑ ර ලියති පින්පව්පල අනුසා ර
මී ර නැත්ලූ යමරජුගෙන් අවකා ර

සතර පොහොයෙහිවත් * පරදාරාදී පාපකම් නොකරව්, චාර සෙතඟ පොත අයනොහැර ඇව්දිත්ය, පින්පව්දෙකේ විපාක අනු සාරය නොහැර ලියති, යමරජ්ජුරුවන් කෙරෙන්එන අවතාර රූප යත් මිහිරි නොමැත්තේලු.

11 කන්දේ ලියන නයිදේටයි කිය න් නේ
දිරණ ගෙවල් නුඹ කුමටද තන න් නේ
ගෙයක් ඇර ගෙයක් නොතනා ඉඳි න් නේ
ගෙන් ගිය දා ගේගිනිලති බොල න් නේ

පඤ්චස්කන්ධයෙහි සැප දුක් උපදවන අවිද්‍යා සඞ්ඛ්‍යාත මොහයට කියනු ලැබේ. ජරාවට පත්වන ශරීර නමැති ගෙවල් නුඹ කුමකට තනන්නෙහිද? ශරීර නමැති ගෙයක්හැරගොස් අන්‍ය එබඳු ගෙයක් නොතනා ඉඳින්න, බොලන් ඒ ගෙයින් මියගියදාට එම ගෙය සැයේදී ගිනිලන්නෝය.

12 ක න් දේ ගෙදර දොර නවයක් සදා ලා
නි න් දේ ඉන්ට තද ඇනයතුරු ලා ලා
බැ න් දේ නවසියක් වැල්ගෙන ගොතා ලා
ම න් දේ යන්නෙ අප තනියම දමා ලා

පඤ්චස්කන්ධ නැමති ගෙදර මුඛ චාරාදි චාරනවයක් සාදනිද ඉඳීමට යොග්‍යවූ තදවූ ඇන යන්ත්‍ර ලූවාක්මෙන් යොදා නවසියයක් නහරවැල් ගෙන ගැටගසා බැන්දේය. දැනට පඤ්චස්කන්ධය වන අප තනිවම දමා මිය යන්නේ මක්නිසාද?

13 දෙ න් නා ඉඳින කන්දේ ගෙදර ඇතිග තී
ඉ න් නා එපස්දෙන පස් අතකට අදි තී
ව න් නා මිසක්ගෙන්ගෙනයනදෙයක්නැතී
ද න් නා අයෙක්නම්මගනොසිට පලය තී

කුශලාකුශල කම් දෙදෙනා ඉන්නාවූ පඤ්චස්කන්ධය පිළිබඳ ශරීර නැමති ගෙදරෙහි ඇන්නාවූ ගතියනම් එහි වැසිවූ රූප තණ්හා ආදිවූ පස්දෙනා රූප ශබ්දාදිවූ අරමුණු පස පස් දිසාවට

---

* මේ පොහොය සතරෙන් යුත් මාසයබව හැගේ එවිට දෙලොස් මාසයට ඇතුලත්වේ. මෙසේ සැම අවුරුදුම මිට ගැණේ

අදිත්ය * ඇතුල්වුණා මිසක් ශරීර නමැති ගෙයින් ගෙන යන මෙදයක් නැත්තේය, චතුරාර්‍ය සත්‍යදන්නාවූ අයකියෙක් නම් සොවාන් ආදිවූ මාර්ගවල නොසිට පල සතරත් ලබා නිර්වාණයට යන්නේය.

14 ඉ න් ද් සි මෙලොව සත්ථිරයයි සිතා ලා
ක න් ද් සි බත් බොජුන් රසකොට යොදලා
බ න් ද් සි පනත් කිකලද සිතූ නැමී ලා
ය න් ද් සි දූත් අතුරමඟ අප දමා ලා

මෙලොකය ස්ථිරයයි සිතා ඉන්නේද, රසවත්කොට සාද ආහාර අනුභව කරන්නේද, ප්‍රාණයත් කොයිකාලයක නමුත් හග්න වන්නේද, (එකල) ශරීරය නමැති අප අතරමග දමා සිතූ නැමී යන්නේය.

15 එකත් දෙකත් සය මුල්කොට දනී නම්
අටත් පහත් නවයේගුණ දනී නම්
ප න් හැර නිලක් පොරවාගෙන සිටී නම්
නොමඳව සකිය හැමටම මලවිසා නම්

(එකක් දෙකත් සයමුල්කොට යනු නවයයි, එනම්) නවලොව්තුරා ධර්මය දනීනම් අටසිල්ද පන්සිල්ද (ඉතිපිසො භගවා අරහං ඥනාදි) නවගුණයද දනීනම්, සුදුවස්ත්‍රය හැර කසටපාට වස්ත්‍රය පොරවාගෙන සිටීනම්, මිත්‍රය සියල්ලටම ආලය වැඩීම් දුරුවන්නේය.

16 අට සියයක් කඩ සන්දින් ඇති ප සි යා
නව සියයක් වැල්බාිනින් බැඳි ප සි යා
කරු දෙකකින් උසුලාගෙන යන ප සි යා
කොතන දමද්දෝ නොදතෙයි කයි ප සි යා

අටසියයක් ඇටසන්ධි ඇත්තාවූ නවසියයක් නහරින් බඳිනලද් දවූ, පාදෙකකින් උසුලාගෙන යන්නාවූ, පසුම්බියක් සමානවූ ශරීරය (මරණින් මතු) කොතනක දමද්දෝහෝයි නොදන්නේ.

---

* මෙහි ඇතුල්වීම නම් විසාඛදුණයාගේ හටගැනීමයි

17 නව සියයක් වැල්බැඳිනින් කළ ගෙ   ත් ත මී
අට සියයක් සන්දින් ර්ටම ව   ත් ත මී
තන පිස මවාලා ඒ කරපුව ගෙ   ත් ත මී
මෙලොව කුමන නාටකයේ අනි   ත් ත මී

නවසියයක් නහරින් ගොතනලද්දවු අටසියයක් ඇට සන්දින් ර්ටම එකතුවුයේය; තුනුවණ ප්‍රත්‍යයෙන් හෙවත් අවිද්‍යා ප්‍රත්‍යයෙන් නිර්මිතකර ඒ ශරීරය ගොතනලද්දේය. මේ ලොකයෙහි සියල්ල අනිත්‍ය බැවින් කුමන නැටීමෙක්ද ?

18 මාළු අටකි වී නැලියකි පෙර ග   ත් තේ
සැරයටි දෙකකි තඹසැළියකි ඒ ම   ත් තේ
සැඳිකටු දෙකකි ගිනිකටුවකි ඉකුරු   ත් තේ
මෙලොව කුමන නාටකයේ අනි   ත් තේ

අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන, කර්මභව මනොසංචෙතනා යන බීජ පංචකය පෙරගත්තේය (හෙවත් මේ ජාතියෙහි සත්වයාගේ සෑදීමට පළමුවෙන් උපකාරවූයේය) ඒ හෙයින් තඹසැළියක් වැනි ඔළුවද සැරයටි දෙකක් බඳු පාදෙකදවූයේය. ඒ අතරෙහිම සැඳි කටුදෙකක් වැනි අත්දෙකද, අග්නිකාෂ්ඨයක්වැනි පුරුෂ නිමිත්තද ඇතිවූයේය, ඒ සියල්ල අනිත්‍ය බැවින් මෙලොව කුමන නැටීමක්ද?

19 අ ර ණ යට තිබුණු කුණුඇට සැකි   ල්ලා
අ ර ණ එකෙක් ඇවිදියි ලොව මුළු   ල්ලා
පොරණ කොටු අකුරකි ලොව සිය   ල්ලා
ම ර ණ තිබුතැන් දන්නේ දෙප   ල්ලා

ආරණ්‍යගතව තුබුණු ධාතුන් ආහරකොට අනුභව කිරීමෙන් හටගත් ධාතුගුණයෙන් සැදුණු දෙතිස් කුණපයෙන් යුත් ශරීර ඇට සැකිල්ල ඇරගෙන චිත්තය නමැති අයෙක් ලොව මුළුල්ලෙහි ඇවිදියි, ලොවසියල්ලන් විසින් පුරාණ කාලයෙහි කරනලද කුශලා කුශල කර්මය නමැති දේවපාලතෙමේ මරණය තුබුතැන් දන්නේය.

20 මොලොව දනා කොයි අයටත් යුතු අයු   තු
උපන් තැනම පල පැසුණා කියයි ග   තු
කන්දක නොවෙයිකන්සක තිබෙනකන්පො
මෙකී පද සතර සත්නේ ඉතා යු   තු

මෙලෝකයේ උපදින්නාවූ කාටත් අයිති යුක්තියනම් මාර්ගය උපන්තැනම ඵලය ඇති ලෝකෝත්තර ගතියට පැමිණීමයි පඤ්චස් කන්ධය පිළිබඳවනොව, එයින්පිට මෙහි කැමතිවියයුතු පැමිණීම ඇත්තේය, මේ කියනලද සතරපාදයාගේ සත්තය ඉතා යුතුවේ.

21 ක ලේ උකුල සතරකි ගාව නා වා
ම ලේ පතල අසුඋණීනම් සුබා වා
නි ලේ ඇදින දූන කලනම් සැබෑ වා
ජ ලේ නොදූන එතරක් දුටු ගොනා වා

ගෞතම නායකයන්වහන්සේ විසින් ප්‍රකාශකළේ සත්‍ය සතරක්ය, තණ්හාවෙනි පතලාවූ සුභනිමිති ගැනීම ආදිය මේ සතරට අසුවුණානම්, පැවිදි තනතුරු ඇඳින සත්‍යධර්මය භාවිතා කළානම්, සංසාර නමැති ජලයෙහි එතෙර ඒ ජනසමූහයා දුටුවාවෙයි

22 උ ද ය ගමන් යන්නේ සතර පයකි නී
මැ ද ය ඉරමුදුන යන්නේ දෙපයකි නී
වි දි ය සැපත් අවරට ගිය තුන්පයි නී
සොඳය මෙපද තේරුවොත් නුවණකි නී

බාලකාලයෙහි සතරපයින් යන්නේය, මධ්‍යම අවස්ථාවෙහි දෙපයින් යන්නේය, සැපවිද මහළුවූඉක්බිති පාදෙක සැරයටියය යන තුන්පයින් යන්නේය; ඥාණයෙන් මෙපද තේරුවොත් යහපති.

23 ක ල ක ට ක ට මවුදෙනනේ කිරිබී මා
ක ල ක ට ක ට රසපලවැල වළඳී මා
ක ල ක ට ක ට කෙතකට බැඳි වැට සේ මා
ක ල ක ට ක ට පට මල්ලේ කටසේ මා

එක්කාලයකදී මූඛය මවුගේ දෙතනෙහි කිරිබීමකරයි, තවත් (තරුණ) කාලයකදී රසවත් ඵලවැල වගී වැළඳීමකරයි, (දත්සෙල වෙන) කාලයකදී මුඛය වෙලකට බැන්දාවූ වැටක් සාමානය. තවද (දත් වැටුණු පසු) කාලයකදී මූඛය රෙදි පසුම්බියක කටක් මෙනි,

24 ඉස පහ නැතිසෙයින් මිටි සතර ගෙනිය   ති
සතරවාසලට සුළුදෙර සතක් ඇ   ති
එක් වාසලක වැසි වසිනාතුරු ඉඳි   ති
කියනු නුවණැතිය තුන් දහමුණු තුනක් ඇ ති

පඤ්චකාම ආසා නැතිසෙයින් (සෝවාන් ආදි මාර්ගඵල) සුවල සතර ගෙණයන්නේය, චතුරාර්‍ය සත්‍ය නමැති මාළිගාවට සප්ත බොධ්‍යාඞ්ග නැමති කුඩා දෙරවල්හතක් ඇත්තේය, මරණය පත් වනතුරු එක ආත්මභාවයක ඉන්නේය බුදුපසේ බුදු මහ රහත්යන මුණීන් තුන්දෙනෙක් ඇත. නුවණැති තැනැත්තේ කියව.

25 ලියක් ගියා දූත් තුන්මස පිරෙ   න් නා
ළසඳ ගොසින් කළුවර දවස එ   න් නා
රිකිලි බඩ ගොයම් කිරිවැද පැසෙ   න් නා
තිරිසන් අපට තනි නිදි පුරුදුවෙ   න් නා

බුදුන් ජීවමානව වැඩසිටි කාලය ගතවී දූන් සහස්‍ර තුනක් පිරී එන්නේය. ලෝකයේ කුසල්කරන කාලය ගොස් පව්වූ කාලය එන්නේය. පින්කරගත් අය මාර්ගඵලවලට පත්වන්නාහුය. එයින් පිට තිරිසන්ගති ඇති අපට හුදකලාවූ වාසය පුරුදුවන්නේය.

26 කිරලා කකුල් දෙක අරගෙන තෙමීග   ති
දිරණා සම්කඩක් ඇඳලා පෙරවග   ති
මෙලොව වස්තුවට මදියයි සිතාග   ති
පන යන දට සුනුදඹ විතරවත් නැ   ති

සත්වයා කුසලාකුසල කර්මදෙක කරගත කෙලෙශයන්ගෙන් තෙමීගන්නේය, දිරන්නාවූ සමක් ශරීරයෙහි වසාගන්නේය. මෙලොව වස්තුව තන්හා වසයෙන් මාගේයයි සිතාගන්නේය. මැරෙණ දවසට බම්බුකඩක් පමණවත් තමන්ට අයිති නොවන්නේය,

27 අ ඳු ර කි දූරකි දූරැ කතරකි කාවල   කී
අගල කී වැටකී පාරකි දෙරකී යතුර   කී
වෙනසකී සකකී මම කී බසකී තෙපුල   කී
අ න ග කී සුදකී ලොවනැති දුක කියස   කී

මෝහාන්ධකාරයක්ද; රූපාරූපතණ්හා නමැති දූරක්ද, සංසාර යෙහි ගමන්කිරීම නමැති දුර්ගමනක්ද, ලෞකික කුශලකර්ම නමැති රක්ෂාවක්ද, මාන නමැති අගලක්ද, පුත්‍රදාරාදීන් නමැති වැටක්ද, සිසිවිලි ගමන්කරන්නාවූ මාර්ගයක්ද, කායවාක් මනෝ යන වාර යක්ද, පඤ්චනීවරණ නමැති යතුරක්ද, ජරා නමැති වෙනසක්ද, මමය මගේය කියන සක්කාය දෘෂ්ටියක්ද, එය ප්‍රකාශකර කියන කිමක්ද, අනඞ්ගයාගේ යුධයක්ද, ලොව නැතිතරම් මහත් දුකක්ද මිත්‍රය, කියව.

28 ක න් දකි ගසකි අතු සතරකි පල පස කී
ඉ න් අතු විහිදි සකි පස මල පැහැදුල කී
දූ න් නකි විදිසැරකි නිමනැති වන් තැනකි
ඉ න් දැන් මෙපද තේරුව නුවණැති අයෙකි

පඤ්චස්කන්ධ නමැති ගසෙක්ද, ඒ හේතුවෙන් හටගන්නාලද අවිද්‍යා, සංස්කාර, තෘෂ්ණා, මනෝ සංචේතනා නමැති ශාඛා චතුෂ්කයක්ද, ඒ හේතුවෙන් හටගන්නාලද ප්‍රතිසංධි විඥාන, නාම රූප ආයතන ස්පර්ශ වේදනා, යන ඒ පඤ්චකයෙක්ද, එයින් තෘෂ්ණා නමැති අතු විහිදී හටගන්නාලද පඤ්චකාම නමැති දිලි යෙන මල්පසක්ද, එම පඤ්චකාමයයි කියනලද අනඞ්ග යාගේ දුන්නක්ද, විදිනලද ඊතල පහරක්ද; නිමනැති සංසාරය වැදුණ ස්ථානයක්ද ඇත්තේය, එබැවින් මේ පදයන් තේරුව හොත් නුවණැත්තෙකි.

29 හෙ ළා සලෙළුවන් පස්දෙන එක නැව කී
වෙ ළා සුලං රුවලින් යනෙන ගමන කී
නො ළා මෙ අප සතහට බාවිතාව කී
බ ළා තිබාලායයි නැවට රහසෙ කී

පඤ්චකාම තණ්හාව අත්හැර ධර්මය නමැති නැවට නැගී වීර්‍ය නමැති සුළඟින් ඥානය නමැති රුවල් ඇද යන එම ගමනක්ය; මේ පඤ්චකාම ආශාව අත්නොහැර අපේය අපගේය යනු සත්ව යන්ගේ භාවිතාවකී; නුවණැත්තෝ ඥානයෙන් බලා කාමය අත් හැර ධර්ම නමැති නැවට යන්නෝය.

30 ස දෘ ඇණ යතුරු තුන්සිය නවදෙං කී
යොදෘ බැඳි බැම්ම එහි වැල් නවසිය කී
න දෘ මෙ අප සතහට බාවිතාව කී
ස දෘ තිබාලා යයි නැවට රහසෙ කී

ශරීරය නමැති ගෙයි ඇට යතුරු සාද තුන්සිය මස්පිඩක් සහ දෙරකඩ නවයක් යොදා එති නගරවැල් නවසියයකින්ද බැමි බඳින ලද්දේය සත්වයාහට මේ අපේය යන භාවිතාවක්ය, මේ ශරීරය සෑද තිබා පරලොව යයි (නොහොත් නිවන්යයි) අනු භාවයි. මෙය රහසකි.

31 කන්දේ ගසේ පලගත්තේ ඔලො ං ගා
නටුව පරව බිම වැටුණයි රා ං ගා
මගට නැමුණු අත්තේ පළු මූරු ං ගා
මෙහෙමත් ඇද්ද විකුණන කාමර ං ගා

පඤ්චස්කන්ධ නමැති රුකෙහි මහත් ආර්ය ඵලයක් හටගත්තේය. තණ්හාව උපදින හේතුව මලානික වීමෙන් රාගය පහවූයේය. ආර්යමාර්ගයට නැමුණාවූ සිතෙහි රාගය විනාශවන්නේය. මේ ආකාර විනාශයට පැමිණෙන කාම ලාභයක් ඇත්තේද.

32 අ ඹ ය විදපු සතහට කිමදෝ දෙ න් නේ
අ නේ ඇති දෙයක් දීලා වරෙ න් නේ
අ නේ මොකුත්නැත්නම්මොකද්දයිදෙන්නේ
අ ට ත් පහත් ගැනදීලා වරෙ න් නේ

මිසදිටු නමැති විෂ ඵලය විද්දවූ සත්වයන්ට කුමක් දියයුතුද; අවබෝධ කරනලද ආර්යධර්මයක් දීම යුතුය. එවැනි අවබොධයක් නැත්නම් කුමක් දියයුතුද, පන්සිල් අටසිල් දියයුතුය.

33 කන්දේ කෙටුවයි සේනේ ඉර ණේ ඩූ
මූල්බිජු වපුළ පළමුව පත් ඉර ණේ ඩූ
යන්ට යනතුරා රුකලා කළ සෙ ණේ ඩූ
යන්ට යනදාට යන්දැයි මා. ණේ ඩූ

පඤ්චස්කන්ධය නමැති සේනේ අවිද්‍යා තෘෂ්ණා නමැති මුල් කොටා කුසල් නමැති බිජු වපුරා පළමුකොට මාර්ග ඵල * දෙකට පැමිණෙන්නේය. පිරිනිවන්පෑම දක්වා ඒ මාර්ගඵලයෝ සිට පිරිනිවන්පාන ක්ෂණයෙහි නැතිවී යන්නාහුය.

34 මෝල් තිස්දෙකක් සැළියක දමා ගෙ න
පොළන කුල්ලකුත් සැන්දත් අතින් ගෙ න
දිරණ සම්කඩක් ඇඳලා පෙරව ගෙ න
දෙපිට සිල් ඔරුව තිරනැති කයට ගෙ න

---

* මාර්ග සතර හා ඵල සතර නාමවශයෙන් දෙකක්කොට පෙන්වා තිබේ.

මූඛ නමැති සැළියෙහි දත් නමැති මොහොල් තිස්දෙක ඔබා ගෙන කුල්ලක් සමාන දිවද හැඳි සමාන අත්දෙකද මේ ශරීරය වම් අනතගීත කරගෙන ජරාවට යන්නාවූ සම්භාඞක් ඇඳිම සහ පෙරඞීම කරගෙන දෙපිමෙහිම හිල්ඇති ඔරුවක් සමානවූ අස්ථිර ශරීරය (සදකාලික වශයෙන්) ගෙන (වාසය කරන්නේය.)

35 අපේ ගමට අප යනකල නිකම් අති　　න්
අප ගියකල එති නෑයෝ වටින් පිටි　　න්
ඒ ආකල අප දෙන්නේ කිම්ද ඉති　　න්
එසෙවි ගමට අපි නොයමුව නිකම් අති　　න්

අපේ ගමඩ (පරලොවට) යනකල්හි ( මුතු මැණික් ආදියක් නැතිව) හිස් අතින් අප ගියකල අපගේ නෑයන් නමැති පඤ්චස් කන්ධයෝ වටින් පිටින් අවුත් රැස්වන්නාහ. ඉදින් ඒ ආවාවූ කාලයෙහි අපි කුමක් දෙමුද? එබඳුවූ (පරලොව නමැති) ගමට අපි (කුසල් නමැති මුතුමැණික් ආදිය ගෙන මිස) නිකම් හිස් අතින් නොයම්හ.

36 බු දු න් ගුණය අහසට දික් පතලේ　　ලූ
ද හ ම් ගුණය හිරුමඬලට දිණුවා　　ලූ
ස ගු න් ගුණය තුරු පතිමෙන් බබළා　　ලූ
මෙතුන් ගුණය මොක් පුරයට මඟපෑ　　ලූ

බුදුරජහුගේ ගුණය අහස දක්වා පැතුරුණේලු, ධර්මයාගේ ගුණය සූර්‍ය්‍යා ජයගත්තේලු, සංඝයාගේ ගුණය චන්ද්‍රයා මෙන් බැබලේලු, මේ තෙවැදෑරුම්වූ ගුණය නිර්වාණ පුරයට මාර්ගය ප්‍රකාශ කෙළේලු.

37 බු ද් ධ ං සරණ සිරසේ පිහිටුවා　　ගෙන
ධ ම් ම ං සරණ දෙසවන්ලා පුරා　　ගෙන
ස ං ඝ ං සරණ දිව සළුගත වසා,　　ගෙන
මෙතුන දනිත් නම් උන්මයි මතු දින　　න

බුදුරජාණන්වහන්සේගේ සරණ මස්තකයෙහි පිහිටුවා ගන්නේය, (මස්තකයෙන් බුදුන් වඳින්නේය) දහම් සරණ කන් දෙකේ බහා සම්පූර්ණකරගන්නේය. (කන් දෙකින් බණ අසන්නේය.) සඟසරණ නමැති දිව්‍ය වස්ත්‍රයෙන් ශරීරය වසාගන්නේය, (ශරීරයෙන් සංඝයාට උපස්ථාන කරන්නේය) මෙකී තුන දන්නාහු නම් මතු කාලයෙහි ජයගන්නෝ ඒ තැනැත්තෝමය.

38 බුද්දං සරණ දඬුපත් කොට ගොතාගෙ න
දම්මං සරණ කැඩපත්කොට ගොතාගෙ න
සංඝං සරණ සළුපත් කොට සඳගෙ න
සස ර සයු ර පැද යමි අබය පුරදූ න

බුදුන්ගේ සරණය දඬුපත්කොට (පහුරක්කොට) ගෙතීමකර ගෙන, දහම් සරණය (යානපාත දැකීම පිණිස) කැඩපතක් මෙන් ගෙතීම කරගෙන, සඟසරණය වස්ත්‍රයක් (රුවලක්) මෙන් සාද ගෙන, සංසාර නමැති සාගරයෙහි පැද නිවන්පුරය දක්වා ගමන් කරමි.

39 රබ්බඩ පසක් දෙසි දෙලොසක් අරග න් න
ලුණුද ලකක් අඹ තෙළෙසක් අරග න් න
අ ට න් පහන් මල්ලකලා බැඳග න් න
නුඹේ ගමට නුඹ යහතින් පලය න් න

පඤ්චසීලයද, දොළොස්වැදෑරුම් ආර්‍ය්‍ය සත්‍යයද, ලක්ෂගණන් සංවරසීලයන්ද, තෙළෙස් ධුතාඞ්ගයන්ද, නවලොවුතුරා දහම් හෝ නවගුණයද, හිතෙනිලා බැඳගෙන නුඹේ (නිවන් නමැති) ගමට නුඹ සැපසේ ගමන් කරපන්න.

40 අට කරයුරු අටකර යුරු සාරින් ක රා
අට එ නැගී එන මුනිරජගෙ පෙම්බ රා
අට අනකට නැමුනයි අඹ කිත්ති බ රා
අඩ මසකට නුදුටිම් සඳ කෙලින් පු රා

මහාබ්‍රහ්මයාගේද, සතරවරම් රජදරුවන්ගේද, අතින් අතට වැඩ (සර්වඥතාඥාන නමැති) අටල්ලට නැගී වඩින්නාවූ; ප්‍රේමයෙන් බරවූ බුදුන්ගේ හිත ආර්‍ය්‍යමාර්ගී අටවතැමුණේය, උන්වහන්සේගේ ඒ හිතෙහි උදුඇට අඩක් පමණවත් කෙලෙසයන්ගේ පිරීමක් නුදුටුවෙමි.

41 දසබැද්දකට වැදසිට මගකට බසි න
අ ට එළියට වැද සත්විල පැන් බොමි න
සගොඩක ට නොවැද සිව් ගොඩක යතිදැන
තුන්මසකින් යන ගැතු කියව දෙමහි න

කාමාදි දස සංයොජන නමැති වනයට වැදී සිට ශාසන නමැති මගට බසින්නේය, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග නමැති එළියට වැස සප්තබොධ්‍යාඞ්ග නමැති විලෙහි භාවිතාකිරීම නමැති පැන් බී

සවැදෑරුම්වූ ඉඳුරන්ට කෙලෙස්වැද්ද නොදෙවා, චතුරාර්‍ය සත්‍ය නමැති බොධ සතරෙහි දැනයෙන්, බුදු පසේබුදු රහත් යන තුන් බෝධිය සපයීකාරමින් සමථ විදර්ශනා භාවනා තෙලෙස් ධූතාඞ්ග යන දෙමාර්ගයෙන් යන්නාවූ ගැත්තා (කව්රෙක්ද) කියව.

42 ම න මෙන් පෙර පැවති දන්වැටකි නිත්තේ
තැන තැන පොකුරඹ රස මී පලග ත්තේ
ගුණ නැණයුත්, දනෝ පිළිවෙත්කරතිත්තේ
දැ න ගෙන කන අයටදැන්මයි රස ඇ ත්තේ

සිත්වූ පරිද්දෙන් පරලොවදී නොකඩව පවත්වනලද දන වෘත්තියක් ඇත්තේය, (නැවත) භවයෙන් භවය (එයින් ලැබූ) මහත්ඵල මහානිශංස නමැති මධුර ඵලය ලබන ලද්දේය, ගුණයෙන් හා ඤාණයෙන් යුක්තවූ ජනයෝ නොකඩව පිළිවෙත් පුරත්තෝය, නුවණින් දැන ඒ පිළිවෙතින් උපන්නාවූ විපාකය අනුභව කරන්නාවූ අයට රසඇතිබව දැනීම වේ.

43 එන ගමනේ මාවත කුඹුරු සා ගෙනේ
යන ගමනේ දළදා වී වපුර ගෙනේ
තෙප් ඉතිනේ වැට සවිකර වෙලා ගෙනේ
දෙන් තොක් ඉඳිති පැලපත දිය නමාගෙනේ

(ආර්‍යයන් මාර්ගඵල අවබොධ කිරීමට) එන්නාවූ කාලයෙහි දන ශීල භාවනා ආදී පින් කුඹුරු සාරවත් කරගන්නෝය, මාර්ගඵලාවබොධකොට (නිවන්පුර) වඩිනා කාලයෙහි ධාතු නැමති ධාන්‍යයන් විසුරුවා හරින්නෝය, (සබ්බසිනි), ඉතින් තෙපි (දන සීලාදී) වැට සවිකර වෙලාගනිව්, (අවිද්‍යා තෘෂ්ණා නමැති) දෙදෙන (සසර සතු නැමැති) අඞකුරය (හටගැන්වීමට සිත) නමාගෙන ඉඳිති.

44 කු ඹු ර සො ද ලූ සරු සාරලූ වැලිපොත ලූ
ව පු ළෙ ති ඹ ලූ නවයාළලූ ගුළුසය ලූ
නි ත් ද සො ද ලූ ඇඳ නරකලූ තුනිතෙකලූ
ක ඩ ලූ දෙ ක ලූ රට සැමටම කාවල ලූ

(ආර්‍ය සඞ්ඝ නමැති) කෙත යහපත්ලූ, සාරවත්ලූ, මොළොක්ලූ යලින් පිළිවෙළින් යුක්තලූ, සිවුපිළිසිඹියාවට හා නවලොකොත්තර ශ්‍රී සද්ධර්මයටද; ෂට්අභිඥාවටද පැමිණියාලූ, (උන්වහන්සේලාගේ)

සමර්ණාට සමවැදීම යහපත්ලු,(උත්වහන්සේලාගේ නමුත්) පඤ්ච ස්කන්ධය (අනිත්‍ය බැවින්) අයහපත්ලු, (උත්වහන්සේලාගේ හිත) ත්‍රිලක්ෂණය මෙනෙහිකරන ඥාණයෙන් ආලෝකලු; (ලජ්ජා භය නමැති වාර දෙකක් ඇත්තේලු; (මෙකී ආයතීක්ෂේත්‍රය) සියලු ලෝකයාටම ආරක්ෂාවලු.

45 වසකින් බේත් ඇඹරීනම් ගොල්ලක ට
උසකින් සයක් තිබෙනෙයි කිව්ව පෙරසි ට
පසකින් තුනක් අරගල්ලා සොඳකම ට
තිසකින් මන්ද සතරක් අත ඇරීයා ට

කාමාවචර (පඤ්චකාමය පවත්නා ලෝකයන්හි හැසිරෙන) කුශල චිත්තයකින් (කායවාක් මනො යන මෙයින්, කොටසක් පිළිබඳවූ යහපත් කුශල් රැස්කරගත්තේ නම්. උසස් වශයෙන් නොහොත් උතුම් වශයෙන් (විපාක දීමට දිව්‍යලොක) හයක් තිබෙත්යයි පෙර සිටි පණ්ඩිතයෝ කීවාහුය. පංචශීලයෙන් යුක්තවූ තුන්සරණය යහපත පිණිස ගනිල්ලා,(බාහිර කටයුතු හැර පෙහෙවස් රැකීම පිණිස) තිස්දවසින් දවස් (පොහෝ) හතරක් අත්හැරියාට වරදක් නැත.

46 බු බු ල කි විලකි එන විලසකි අසමා න
බි ල ය කි තිරසේකි ඇඹරුම් පිටටගෙ න
දූ ඞි ය කු සමග සිට දෙවනුව පිටපා න
දි න සකි රුසිරු සකි මෙලෙසට දූනකියන

(ඒ සත්වතෙම කලල රූප අවස්ථාව ඉකුත්කොට ඇසට පෙනෙන අවස්ථාවට පැමිණිකල්හි) බුබුලක් වැනිය; (ඒ දූඞිවන රූපයට මාතෘකුක්ෂිය) විලක් සමානය; (අර්බුද අවස්ථාව ඉකුත් කොට පෙසි අවස්ථා ආදියට පැමිණීම දියුණුව) එන්නාවූ විලාසයක්ය; (සත්වයා දූඞිව වාසයකරන කල්හි ඔහුගේ විසීමට මාතෘකුක්ෂිය) බිලයක් සමානය; (ඒ සත්වයා) ස්ථිර ස්වභාවට පැමිණකම්යෙන් පිටට ගෙන දූඞිවූ කම් බලයෙන් මෙළොව සිට පිටිපා පරලොව යන්නේය; මෙසේ (සත්වයා නැවතනැවත උපදවන්නාවූ කාම තණ්හා භව තණ්හා විභව තණ්හා යන මොවුන් දූත කියන්නේය.

47 අඳුරකි දු රකි විලසකි නොසකි නික්මේ න
ඇල්ලකි දෙළකි කඳුරකි කොමළඳුන් එ න
මොනරෙකි පිළකි නැටුමකි බසකි අඬල න
කැකුළකි මලකි පුස්පකි සුවඳ විහිදෙ න

අඳුරනම්, අවිද්‍යාවයි; දුරනම්, සංස්කාරයයි; විලසනම්, විඥානයි; නොසනම්, නාමරූපයි; නික්මීමනම්, සළායතනයයි; ඇල්ලනම්, ඵස්සයයි; දෙළනම්; වේදනායි; කඳුරනම්, තණ්හායි; කොමළඳුන්නම්, උපාදානයි; ඒමනම්, භවයයි: මොනරානම්, උත්පත්තියයි; පිළනම්, ජරාවයි; නැටුමනම්, මරණයයි; බසනම්, සෝකයයි; අඬලීමනම් පරිදෙවයයි; කැකුළනම්, දුකයි; මලනම්, දෝම්නසයි; සුවඳ විහිදෙන පුෂ්පනම්, හෘදයට ඉතා වේදනා උපදවන උපායාශයයි.

48 ස ක ඳ ඇඳපු ඔලියලවට කැදූ ල්ලයි
ස ක ඳ බැඳපු කොන්ඩේ මල් කැරූ ල්ලයි
ස ක ඳ කරලන්ට පඬුකාර තැ ල්ලයි
ම ළ ඳ ඉතින් පණුවන් කුණු කැදූ ල්ලයි

කෙලෙස් සහිත පඤ්චස්කන්ධය වචකොට අඳිනලද වස්ත්‍ර සමූහයක් ඇත්තේය, කෙලෙශයන් සහිත පඤ්චස්කන්ධයෙහි බඳිනලද කොණ්ඩයෙහි මල් කලඹක්ද ඇත්තේය කෙලෙස් සහිත පඤ්චස්කන්ධය විසින් කරලීමට රුවන් ආදී මාලා සමූහයක්ද ඇත්තේය; ඉතින් මැරුණදට කුණුපණු කැදූල්ලෙක් වහන්නේය

49 වැ ට බඳිනට කීසැටි අසව ගෝ තේ
වැ ට ඉනි තුනක් සිටුවාගන්න මැ තේ
රි ටි තුන සලකුණෙන් බැඳගන්න ඇ තේ
අ ට පහ නොදනිතොත් පලයත් අබු තේ

ගෞතමයන්වහන්සේ කුශල් නමැති වැට බැඳීමට වදල සැට් අසව, පළමුකොට තිසරණය නමැති කණු තුනක් සිත් නමැති ඉඹමෙහි සිටුවාගනුව, අවශාන භාගයෙහි නෙවත් තුන්වෙනුව අනිත්‍යය දුඃඛය අනාත්මය යන ත්‍රිලක්ෂණය මෙනෙහිකිරීම් වශයෙන් භාවනාකොට තිසරණ සීලය අෂ්ටාඞ්ගසීලයත් නොදනිතොත් අභාවයටයව (විනාශවෙව.)

50 හැළියක් විතර වී වපුළසි ලිය ද්දේ
රළු ව ක් සිතාගන්නට කරපු යු ද්දේ
කෙළියක් සිතාවන් ඉදි මිදුල මැ ද්දේ
එළි බැ ස ලියෙක් කී සරුපේ වැරැ ද්දේ

(ගෞතමයන්වහන්සේ) අට මිටක් පමණ කුසතණ බෝමැඩෙහි වැපුරුයේය. (විසුරුයේය) එයින් දහතුන් රියන් දියමනති ආසනයක් පැනනැංගේය (මාරයාතෙමේ) රළුහිතක් හිතා ඒ වජ්‍රාසනය ගැනීමට යුඞකෙළේය. කලක් පිරූ පාරමිතා සිහිකරමින ඒ ආසන මධ්‍යයෙහි (ගෞතමයන්වහන්සේ) වැඩහුන්සේක මහා පෘථිවිය නමැති සත්‍රිය කියනලද සාක්ෂිය නිසා (මාරයාට) වැරදුණේය.

51 දෙබසක් කිව්ව අදිකාරම් ළංවසි ට
බ ස ක් කියා තුන සිටුවා සුරලොව ට
අසෙකු ගන්ට මිලකරවා ගොනෙක් සි ට
අසුගෙ පිටට ගොනු නැගුණා කියන් ම ට

අධිකරණ (විවාද) කාරයා (මාරයා) ළංවසිට දෙබසක් (තමන් හා තමන්ගේ පිරිසද යන දෙපක්ෂයෙන් සාක්ෂි) කීයේය; (මහා පෘථිවි තොමෝ ඊට විරුඩව) තුන්වරක් සාක්ෂි කියා (මාරයා) තමන්ගේ මාරදිව්‍ය ලොකයට පලාහැරියාය; ගෞතමයන් වහන්සේ ආසනය ගැනීමට මහ පොළව ලවා දෙස්කියවා ආසනයෙන් නොබැස ඒ ගෞතම නායකයන්වහන්සේ සර්වඥතාඥාන නැති ආසනය පිටනැගුණුසේක; ඒ බව තෝරා මට කියව.

52 සතර තැලිතලා සිටිනා ගොනෙකු දැ ක
විතර මූණු සතරකි උගෙ එක කුරෙ ක
සතර දෙනෙක් වැදූවයි එක මීදෙනෙ ක
සතර කුරෙකි තව එනවා එක කුරෙ ක

ගෞතම නායකයන්වහන්සේ රාගය, ද්වෙෂය, මෝහය යන පව් තුණද මතු භවයෙහි උපදනතිය ගෙනදෙන කර්මයද, යන මේ සතර තැළීමකොට නොහොත් විනාශකොට (සර්වඥබවට පැමිණ දකිමට සුදුසු සියලු කර්මයන්) දැක සිටිනාසේක. උන්වහන්සේගේ (භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන මහ පිරිස් සතරක් ඇත්තේය, නොහොත්, සතර පරිශුඩ සීලනමැති මගත් මූව සතරක් ඇත්තේය (මේ කල්පයෙහි පෘථිවිතලයෙහි බුඩාඞකුරයන් වහන්සේලා සතර නමක් බුදුබවට පැමිණියෝය තවත් (මෛත්‍රී නම) එක් බුඩාඞකුරයන්වහන්සේ නමක් මතු මේ කල්පයටම දෙව්ලොවින් වඩින්නන්ය.

53 වරාදළු තුනක් තුන්දෙන නෙලාගෙ න
උස් සුඹසෙක් බිඳ දළුවක් නෙලාගෙ න
උදූසනාම දූ ඉසකෙස් වනාගෙ න
වරාදළු අඩියි ඉරිදූ උදූස න

(කකුසඳ කෝනාගම කාශ්‍යප යන) සර්වඥයන්වහන්සේලා තුන් නම තුන්වරට සර්වඥභාවය ලැබුවාහුය. උත්කෘෂ්ට විශිෂ්ටයක් ඇති අප ගෞතම සර්වඥයන්වහන්සේ දසදිම්බරක් මාරසේනාව පරාජයකොට සර්වඥතාඥනය ලබා ඉරු උදයෙහිම උත්තම සර්වඥතාඥනය ලැබූ සතුටින් අනෙක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං) යනාදී වශයෙන් උදාන වාක්‍යය ප්‍රකාශ කෙළේය.

54 ගොනු ඇවිදින් මඩවල දිය බොන කලට
එ නු එඬෙරා කිරි දෙවනට සකවන ට
මීදෙන් ඇවිත් දෙසි නෙළමින් සූරත සි ට
ය නු එඬෙරා හිස්සක වන වනා පි ට

ගෞතම නායකයාණන්වහන්සේ (බෝ මැඩෙහි (වජ්‍රාසනයෙහි) වැඩහිඳ සම්‍යක් සම්බෝධිය අවබෝධකිරීමට විශිෂ්ටකරන වේලාවට යුද්ධකිරීමට සවකීය පිරිසත් හා සමඟ වසවර්තීමාරයා එනතට ආයේය. (ගෞතම නායකයාණන්වහන්සේ) දක්ෂිණ හස්තය මහපොළවට දිගුකර කථාකළ කාලයෙහි මහිකාන්තාව දෙස් කියමින් සිටිය කල්හිම ආයුධ ආදිය දමා හිස්අතින් වසවර්තීමාර තෙම සියපිරිසත් හා සමග තැතිගෙන මේ මිනිස් ලොවෙන් පිටවී දුවන්ට වන.

55 ති රී වා නෝ යටගිය දවස පැණිබො නා
එ ම වා නෝ දෙසිවල සිටිය මිදෙ නා
හ ද පා නෝ වතුවල කාපුවයි ගො නා
සොඳ යි අ නෝ දූනගන්තොත් මෙපදතු නා

අතීතකාලයෙහි (අපගෞතමයාණන්වහන්සේ) තණ්හාවෙන් වෙන්ව සර්වඥතාඥනය අවබෝධ කිරීමට (වජ්‍රාසනයෙහි වැඩ හුන්නා කාලයෙහි මාරයාගේ තෘෂ්ණාවේ වරද ප්‍රකාශකර මහා පෘථිවි නමැති කාන්තාව දෙස්කියමින් සිටියාය. ගෞතම නායකයාණන්වහන්සේ (ප්‍රඥ නමැති පහන් ආලෝකයෙන් (තමන් වහන්සේගේ) චිත්තයෙහි (මතු භවයෙහි උත්පත්තියට හේතුවන අවිද්‍යා නමැති වස්තුව (නොහොත් අන්ධකාරය) වැළැක්වූයේය, (විනාශ කළේය) අහෝ විස්මයකි, මේ පදප්‍රාය දූනගතහොත් යහපත්ය.

56 ධස්සකි ලස් දැයකි කිවිසි පිළිපොර ණ
මස්සකි එරන් අට අරගණ මුළුදෙර ණ
ල ස් ස පයෝදර විදුලියමෙන් පොර ණ
මස්සක් බැගින් තුන්ලොව එකවිට හැඹූ ණ

සූර්යවංශයෙහිවූ ශාක්‍ය බෝධිසත්වයන්වහන්සේ ලක්ෂයකි කියා ගණන්නැතිමටනොහැකි ආත්මයනහි නායවාක් විතතයෙන් සුචරිතයන් පුරා පුරාණයෙහි ඇස් ඉස් මස් ආදී අද්‍යාත්මිකයේද) පුත්‍රදාරා (ආදී බාහිර)යේද දානයකොට මහපොළොව කම්පාකරවා ආර්‍ය අෂ්ටාංගික මාර්ගය අවබෝධයකොට (නොහොත් උපේක්ෂා ඥානය අවබෝධකොට) විද්‍යා, (ඥාන)යෙන් සත්වයාගේ හිත් පූරණය කරමින් මේඝයන් ලක්ෂයක් වශීකරන්නාක්මෙන් (දසදහසක් සක්වළට අසිති) මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්මයන්ගේ තුන්ලොකයන්ම එකවිට නාද කරවූහ.

57 අ න ද මහාතෙරිඳුගෙ ගුණ වනා පූ වා
ප බ ද නෙක් සැරෙන් විදලා හෙලා පූ වා
නි බ ද තණපොටේ කුසුමෙන් තෙමා පූ වා
ළැ ම ද තණේ ඇත්තන් රට නසා පූ වා

මහත්වූ සච්වූ ඡන්දරාගය නමැති වන්දයාගේ ගුණවර්ණනාකරණලද නොකඩව නේප්‍ර නමැති ඊගයන් (ප්‍රිය රූප) විදිමින් රාගසහිත වචන ප්‍රකාශකරනලද නිතර තන්හා නමැති මල්පරියෙන් වලදනාලද රටවාසීන්ගේ හෘදයෙහිවූ තණ්හාව (ගෞතමයාණන් වහන්සේ විසින් යටකී ධම්මචක්‍රයෙන) විනාශකරන ලද්දේය.

58 උඩරට පාතරට තොට සතර දූනගෙ න
ඔන්පදු සය මතක්කර බැඳ තබාගෙ න
රුවන් වැලඳී එම ජලයෙන් තෙමාගෙ න
මෙතුන දන්න්නම් උන්මයි මතු දින න

මූලපටන් අග දක්වා (ගහපත්ව, සතර සතිපට්ඨානය දූන ගන්නේය, නවගුණය දූන සිහිඑලවා පඤ්චෝපාදානස්කන්ධ බැඳ තබාගන්නේය. (ආරක්ෂාකොටගන්නේය) අපි නමැති රුවනින් ගැවසීගත් ධම් නමැති ජලයෙන් ගිත සිහල්කරගන්නේය, මේ පදතුන දනින් නම ඒ තැනැත්තෝ මතුජය ගන්නෝය.

59 ර ස වී තිබෙයි හේනේ වැට වැරැ  ල් ලේ
ර ස වී නමුත් පැණිවද රස කැබැ  ල් ලේ
එ ර ස කියා ඇවිදිති ලොව මුළු  ල් ලේ
කුම න පෙරුම්දූසි පිට රෙදි වැරැ  ල් ලේ

ගිහිගෙයි ලාමක සැප කොටස මූලාජනයන්ගේ හිතෙහි රශයක්කොට ඇදී තිබේ; එසේ රසයයි සිතූ නමුත් නුවණින් බලන කල්හි රසකොටස වධයක්මෙන් පෙනීයේ, ඒ ලාමක රාග සහ පතැයි ප්‍රකාශකරමින් (අනුවණ අය) ලොව මුළුද ඇවිදිති, (ඇතුලෙහි පිළිකුල්දේ තබාගෙන) පිටින් රෙදිවැරලි ඔතාගෙන කුමන වික්‍රමයෙක්ද?

60 පාවන් අකුරු මවුතැන් මස ගිරා න  ලේ
පැහැසරවන් සරණ පිටතල වසූළ ක  ලේ
වාදත්කමින් තල ගිරවුන් පාළුක  ළේ
රූපත් ගිරවූ තලගොයිපළට රුකව  ළේ

ශ්‍රීපාදය වැනි ලකුණක් ගලක කොටං විස්මපත්වූ සමනනකූට පර්වතයෙහි දීප්තිමත්වූ (මාණික්‍යයෙහි පිහිටි) ශ්‍රීපාදය එයින් වැසූයේය දනනකමී ආදියෙන් ගෙයක්කොට ඒ ගල්ලැල්ල මුවා කලේය යහපත්වූ ගෞතමයාණන්වහන්සේගේ ශ්‍රීපාද ලක්ෂණයට ගල්ලැල්ල රක්ෂාවරණ යෙක්ද?

61 වාපි ව ජලතලේ රුළපිට මිහීතලෙ  ක
ඊ පි ට කරඹවැල් සතකින් බැඳි වැටෙ  ක
ඊ පි ට ගිරවූ සත්දෙනෙතුගෙ රුකවලෙ  ක
ඊ පි ට රතින් ගිරවෙක් ඊපිට සකෙ  ක

වාපොළොව පිට ජලපොළොවය, ජලපොළොව පිට ගල් පොළොවය, ගල්පොළොවපිට පස් පොළොවය, ඒ පස් පොළොව පිට කරදිය නමැති මුහු දුවැල් සගතකින් බැඳි වැටෙක; ඊ මතුයෙහි සප්තකූට පර්වතයන්ගේ රක්ෂා ව රණයෙක්වෙයි, ඊ මතුයෙහි සප්තකූට පර්වත මස්තකයන්හි සවණීමේරු පර්වතයෙක්වෙයි, ඒ (රත්මෙර) පිට ශක්‍රභවනයෙක.

62 අ බ ර න් මහනෙළුන් මගහිස මහ බැද්දේ
අ බ ර න් ගෙවට සතහර සළුපිට බැද්දේ
බඹ රු න් කෙළිති නදදෙති රොන්වස් බැද්
බඹ රු න් කපා සවසක් ඉදිති බැද්දේ

සිඩාපී-ගෞතම බෝධිසත්ත්වයන්වහන්සේ ගිහිආබරණ මූද වනයෙහිදී ශ්‍රමණපරිෂ්කාර දරා ගෙන දෙව්බඹුන් සතුටුකරවා මහණව වනයෙහිම සතුටුව ඉඳ තවත් සාවුරුද්දක් වනයෙහි දුෂ්කර ක්‍රියාකොළේය.

63 ස ද සදහන් සඳහම් සඳ කුමක් වැ නී
ස ද සදහන් සාව සන් කළා වැ නී
දු ර ඳුදගණ සැළ සඳහන් කුමක් මෙ නී
ස ද හන්දිය දිය පල්ලෙන් නේත්‍ර මෙ නී

සත්පුරුෂයන්ගේ චිත්තයෙහි සඳහන් කරණලද සද්ධර්මයකුමක් මෙන්ද (කීවහොත්) චන්ද්‍රමණ්ඩලයෙහි සාලපය සඳහන්කළාක්මෙනි (එසේ ස්ථිරව පවත්නේය) දුර්ජනයන්ගේ සිතෙහි සඳහන්කරණ ලද සද්ධර්මය කුමක්මෙන්ද (කීවහොත්) ලෝකයා විසින් දියෙහි අඳිනලද ඉරමෙනි, (එසේ ස්ථිරනොවී මැකීයේ)

64 බොරුවක් නොවෙයිමකියන්නේමගේතුඩින්
නවසියයක් කඳ ඇඳ බැඳ සතර පිටි න්
අවල සබල සතරක් ගෙන දෑලවරි න්
තනිව ඉඳුම සයුරේ පදිනවා දුටි න්

මවිසින් හොතා මගේ මුඛයෙන් කියන්නේ බොරුවක් නො වේය. රූපස්කන්ධ සංඛ්‍යාත ශරීරය හතර පැත්තෙන් නවසියයක් නහරවැලින් ඇද බැඳ අත්පා නමැති අවල හබල් හතරක් දෙපැත්තෙන් ගෙන (උපකාර කාරයක්හු නැතිව ශරීරය නමැති ඔරුවෙහි සිතනමැති මිනිසා) තනිවඳුද (සසර) සයුරෙහි පදිනවා දුටුයෙමි.

65 බොරුවක් නොවෙයි මකියන්නේ සඳ ලා
ඔරුවක් තිබෙයි මහමූදේ කිඳ ලා
පළුවක් දෙකක් ගෙන දූලෙන් සඳ ලා
පදිනට බැරිය සසුරේ දිය සිඳී ලා

මා විසින් හද කියන්නේ මූසාවාදයක් නොවේය, අංගීරසයන් වහන්සේ නමැති ඔරුව සංසාර නමැති මහමුහුදෙහි ගමන් නොකොට නැවතී බැසසිටින්නේය. තණ්හා නැමති සාගරය සිඳී ගිය බැවින් පුඤ්ඤාභිසංඛාර ආනෙඤ්ජාභිසංඛාරා ආදී කර්මයන් රැස්කොට සංසාරයෙහි ගමන් නොකොට හැක්කේය.

66 ස ත් ති ය අතට ගෙන පරවී වඩාගෙ න
වි ක් ති ය කියා මීදෙන් බාන බැඳගෙ න
ස ත් ති ය මරා බෝගය කපුනසයෙහෙ න
එ ළි ය කුත් රැගෙන දී වෙලෙහි නතුවන

සත්‍ය ධර්මය දැනගෙන ප්‍රධාන් වීර්‍ය්‍යය වඩා විසතු කාම ක්ලේශ කාමය ක්ෂයකොට ආත්මදෘෂ්ටිය සහගත වූ තෘෂ්ණාව ගමන් කිරීමට නොහැර බැඳදුම්මාක් මෙන් මැඩපවත්වා සත්තිස්බොධිපාක්ෂික ධර්මයන්හි හැසිර නොහොත් සේවනය කොට කෙලෙස් රූක කපා (නසා, සැපතට පත්ව ඥානනමැති ආලෝකය ලැබ ඒ රහතන් වහන්සේලා ලොකයාහට පින් කෙත් වන්නේය.

67 ඇතුළුගෙයි ඇඳේ ළමයා අඬ න් නා
ඉද්දර තිබෙන තණ සුළඟට වැනෙ න් නා
ඉදිරියේ දෙරේ මූතුවැසි වසි න් නා
ගතුවට බයේ දිව ගොළු නොසිටම ය න් නා

චිත්තාභ්‍යන්තරයෙහි (භාවනාකරන කාලයෙහි) අවිද්‍යාවට පීඩාවන්නේය ඒ අවිද්‍යා වාරයෙහි පැවති තණ්හාව(විදර්ශනාඥාණ නමැති) වාතයෙන් විනාශවන්නේය, මනොවාරයෙහි අර්හත්ඵල විමුක්ති නමැති වර්ෂාව වර්ෂාකරන්නේය, ඒ මාර්ගඥානයට භයවී ක්ලේශයෝ නොසිට විනාශයට යන්නෝය.

68 මී ක ද ගොනටුවේ ලැගලා යනකල ට
එමකද සුඹුල දළලනවා විටින්වි ට
දලකද පැනු එපිට ලෝදිය බොනකල ට
මී වැ ද සිටි ගොනුගෙ සලකුණු කියන්ම ට

මාගේශීෂ නාමණාමෙන් ගන්නාලද පඤ්චස්කන්ධ නමැති ගව ශාලාවෙහි වැස පරලොව යන්නාවූ (කාලය විසින් අනුභව කරන ලද) සත්වයාගේ එම ස්කන්ධ ප්‍රත්‍යයන් නැවත නැවත (පසු පසු භවයන්හි) තවත් ස්කන්ධයෝ හටගන්නාහුයයි (දූත) දැක්වූ ස්කන්ධ දුඃඛයෙන් පැන හෙවත් ස්කන්ධ පඤ්චකය උල්ලංඝනය කොට ලෞකික ස්වභාවයෙන් ඉවත්ව කාලය බොමින් (නසමින්) අමෘතමහා නිර්වාණයට ප්‍රවිෂ්ටව සිටි ගෞතම නායකයාණන් වහන්සේගේ සලකුණු මට කියව ?

69 කු ර ක් කම් පහක් වපුළයි බොල න් නේ
හ ර ක් නොකා උන්පිටමයි ගෙනෙ න් නේ
න ර ක් කම් නොවෙයි මේලොවසතුන් නේ
කු ර ක් කම් පහෙන් නැළියයි බොලන් නේ

(සත්වයා විසින් ප්‍රාණඝාතාදි) පස්ප්‍රකාර ක්‍රෑර කර්මයෝ රැස් කරන ලද්දාහුය. අනිකකු විසින් පැහැරගත නොහැකි ඒ අකුසල කර්මයෝ ඔවුන් පිටම ගමන් කරන්නෝය, මේ ලෝක සත්වයාගේ නරක ක්‍රියාවෙනොවේද? ඒ පඤ්ච ක්‍රෑර කර්මයෙන් (නරක, තිරිසන්, ප්‍රේත, අසුරනිකාය යන) සතර අපායෙහි දුක් ලබන්නෝය.

70 ගොනු සිනසේ දරු තුන්දෙනෙකු ඇතිකළා
එම විගසේ විසිතුන් දෙනෙකු බෝක ලා
තව දෙනකුත් එම බානෙන් ගලතා ලා
වසුපැටියා දුවපිය දිවි අතඇර ලා

ගෞතම බෝධිසත්වයන්වහන්සේ (කාය වාක් මනෝ යන) සුචරිත ධර්ම තුන වර්ධනයකොට විසිතුන් නමක් සම්බුදයන් වහන්සේලාගෙන් විවරණ ලබා තවත් ජිනයන්වහන්සේ කෙනෙකුගෙන්ද එසේම විවරණ ලබාගෙන සිත හටගන්නා සියලු කෙලෙශයන් (අත්හැර ලූද) නිවන්පුර පත්වූයේය.

71 උ ප මා කරඬු උපමා කරඬු උපග තේ
උ ප මා කරඬු උපමා සේම ගෙනය තේ
මෙතමා තමා කීවෝ කවුද කටමැ තේ
නොතෙමෙන පිටත් ඉසලනුහැකිදතලප තේ

ආත්මය අපගේය මාගේයයි සිතීමකොට ඥානයෝ පමාවිත් නෝය, ආත්මය අපගේය මාගේයි, යන්න උපමාවක් වශයෙන් ව්‍යවහාර කරගෙනයන්නේය, ආත්මය මාගේයයි බුද්‍රාවට පත්ව මේ කටුක මතයගත් (අඥානයෝ) කවුරුද? ඔවුන්ට කෙලශ වැස්සෙන් නොතෙමෙන්නාවූ අභිධර්මයනමැති තාලපත්‍රය ඉසලීම හැකිවන්නේද? (නොහැකිවේමය,

72 එ ක ත් දෙකත් සයමුල්කොට දැනග ත්න
අ ට ත් පහත් නවයත් ලංකරග ත්න
සියයන් අටත් යන පාරේ නොමය ත්න
සතරක් පසුව යන ඉස්සරටම ය ත්න

නවලොකොත්තර ශ්‍රී සද්ධර්මය දැනගන්නේය, පොහෝදිනෙහි සමාදන්වීම වශයෙන් අටශීලයද නිතරරැකීම්වශයෙන් පංචසීලයද සිහිකිරිම වශයෙන් නවඅරහාදී බුදුගුණයද සමීපකරගන්නේය, එකසිය අටක් ප්‍රභෙද ඇති තෘෂ්ණාවට වසඟව ඒ මඟ නොයන්නේය. චතුරෙරුසඟ පසුකොට යායුතු නිවන්පුර ඉදිරියටම යන්නේය.

73 චිත් ති ය කියා එන වත්නී දැක ඇදි න
සත් ති කියා මීදෙන බාන ලාගෙ න
කිත් ති මි නැතුව දෙසිතුන බෙදූගෙ න
වත් ති ඉඳ තැවෙයි පරවී වඩාගෙ න

ජනදුරාගය (තෘෂ්ණාව) විනාශකොට බුදුබවට පැමිණෙන්නාවූ රත්නය දැක ඇදිනගෙන (ආත්ම දෘෂ්ටියාගේ) ශක්තිය විනාශකොට ආත්ම දෘෂ්ටිය උපදවන තෘෂ්ණාවද විනාශකර ගෙන කීර්තියට පැමිණෙම්යි යනඅදහසින් වෙත්ව ත්‍රිපිටක ධර්මය ලොවෙහට බෙදා ප්‍රකාශකොටගෙන ප්‍රධන්වීයසී වඩාගෙන ආයසී රත්නය දිලිසෙයි.

74 මි තු න ර ස ට සතසිත දෙක යෙදුණුතැන
උ ස බ ර ස ට පැමිණෙයි මිතුනයේ ගු ණ
හ ත ර ප ස ට හිමිවැටෙමින් ගෙවුණුතැන
කන්නි ර ස ට පැමිණෙයි මිතුනයේ ගු ණ

(පරස්ත්‍රීබව හිතින්දූත සත්වතෙම පරස්ත්‍රීසේවනයට යෙදුණ කල්හි ඒ පරදර අකුශලය කාරුණකොටගෙණ ගොන්ව උපදී යි. එසේ සතර අපායට හිමිව වැටෙමින් අකුසලය ගෙවුණු කල්හි ඒ පරදර මෛථුනයේ විශෙෂ අකුසලින් ස්ත්‍රීව උපදියි.

75. ශුද්ධා ගුණ සුද්ධොදන නරපති කුල මහිම ම
බුද්ධාගම මහමායා දේවිදර ප්‍රසූත ම
විද්‍යාධර සකලාගම නිපුනාබහු පඨන මි
ශ්‍රී ගෞතම දයාමූති ප්‍රණමාමිත සරණ ම

76 ත්‍රෛලොකික ත්‍රෛපූජිත ශාස්ත්‍රාගම නිපුන ම
ත්‍රෛභුෂන ත්‍රෛපාවක ත්‍රෛතීර්ථකනිපුන මි
නාලාගිරි ධීරාපද නමිනායක කිරන ම
ශ්‍රීගෞතම දයාමූති ප්‍රණමාමිත සරණ මි

77 පූජිත කුල පූජිතනෘප පූජිත සිර කමල මි
පූජිත හර පූජිත හරි පූජිත එති නිමල මි
පූජිත සුර පූජිතපති පූජිංමහි සමන මි
ශ්‍රීගෞතම දයාමූති ප්‍රණමාමිත සරණ ම

78 ශ්‍රීමහජය ශ්‍රීනන්දන ශ්‍රීමත් නෘප කරණ ම
ශ්‍රීශොභිත ශ්‍රීනාථන ශ්‍රීපූජිත පූනන ම
ශ්‍රීමඞ්ගල ශ්‍රීකුංකුම ශ්‍රීවාදන වදන ම
ශ්‍රීගෞතම දයාමූති ප්‍රණමාමිත සරණ ම

79 කාරුනා මෘත විවිධාගම තරුනාරුණ නයන මි
කාරුනා කුල මකුටාධර සපයා බහු පඨන ම
විදුරු සන කාමානන ධරණීධර පූර්ණ මි
ශ්‍රීගෞතම දයාමූති ප්‍රණමාමිත සරණ ම

80 දනාදන දනාභය දනාගජ සෙවිත ම
දනාසිර දනාවසු දනාජය රුධිර ම
දනාසුත දනාපත දනාගජ රතන ම
ශ්‍රීගෞතම දයාමූති ප්‍රණමාමිත සරණ ම

81 සුද්ධොදන පුත්‍රානන සිඛාපික නෘපති ම
සබ ගුණ විදගම සදුණාවඩි හජිත ම
දඬාභව විනිතිජය බුද්ධාගම විජිත මි
ශ්‍රීගෞතම දයාමූති ප්‍රණමාමිත සරණ ම

( නිමි. )